# ගෙන් භූතයා

කතා:
පෙත්මි රනුල්‍යා බණ්ඩාර



# හේනේ භූතයා

කතා:

පෙත්මි රනුල්යා බණ්ඩාර

පළමු වෙළුම
ලේන් පැටියා

දෙවන වෙළුම
අංකොටාගේ මොලේ

තෙවන වෙලුම
හේනේ භූතයා

කෘතිය පළකරන දිනය
2026.05.10

ISBN No : 978-624-211-336-4

7 ශ්‍රේණිය C
මහා/මහාමායා බාලිකා විදුහල

# පිදුම

මගේ ආදරණීය මහාමායා මවට

මගේ දෙමව්පියන් හා අත්තම්මා

සහ

මගෙ යහළු යෙහෙළියන් වෙත

ආදරයෙන් පුදමි.



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# <u>සුභාශිංසන පණිවුඩය</u>

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

ඔන්න එක්තරා ගමක අන්දොරිස් කියලා ගොවියෙක් සිටියා. මේ ගොවිරාල හරිම නපුරුයි. කාටවත් උදවුවක් කරන්නේ නැහැ. අන්දොරිස් ගොවිරාලට හිටියා සහෝදරයෙක් එයාගේ නම සේදිරිස්. සේදිරිස් දවසක් තමන්ගේ සහෝදරයා වන අන්දොරිස් බලන්න ආවා. එදා රෑ අන්දොරිස් ගමරාලට පැල් රකින්න යන්නත් ඕනි. සේදිරිස්ටත් හිතුනා අන්දෝරිස් එක්ක පැල් රකින්න යන්න. ඔන්න ඉතින් රෑබෝවී එනකොට දෙන්නම පැල් රකින්න බත් මුල් දෙකකුත් බැදගෙන, ලබු කැටේට වතුරත් පුරවගෙන යන්න පිටත් උනා.  දෙන්නත් එක්කම පැලට ගිහින් සේදිරිස් පැලට නැංගට පස්සේ අන්දෝරිස් ගමරාල හේන බලන්න හේන වටේ ගිහින් දඩු වැටේ කැඩිච්ච තැන් සකස් කරලා ගිණි මැලය දල්වලා පැලට නැංගා. දෙන්නත් එක්ක බත්මුල ලිහාගෙන කාල පොඩි හාන්සියක් දැම්මා. ටික වෙලාවකින් සේදිරිස්ට හොදටම නින්ද ගියා. එදා රෑ හොදටම හුලග. ගමරාල බිමට බැහැල ගිනි මැලය අවුලවලා වැසිකිලියට යන්න ඕනි වෙලා හනි හනිකට ගෙදර ගියා.

වැසිකිලියට ගිහින් ඇවිත් ගමහාමිනේට කතා කලා. ගම හාමිනේටත් හොඳටම නින්ද ගිහින් තිබුනේ. ඊට පස්සේ ගමරාලත්  ටිකක් වෙලා ඇල වෙන්න හිතාගෙන හාන්සි පුටුවේ ඇල වුනා. ගමරාලටත් දන්නේම නැතිව නින්ද ගිහින්. ගමරාල සීතල හුළඟට එකපාර ඇහැරෙනකොට එළිය වැටෙන්නත් කිට්ටුවෙලා. ගමරාලට සේදිරිස් ගොයියා තනියම පැලේනේ කියලා එකපාරම මතක් උනා. ගමරාල හනි හනිකට හේනට දිවුවා. එතකොට තමයි ගමරාල වෙලා තියෙන වින්නැහිය දැක්කේ. ගමරාල හේනේ පැලේ අවුළුවලා ආපු කුප්පි ලාම්පුව හුලගට පෙරලිලා පැල සම්පුර්ණයෙන්ම ගිනි අරගෙන. සේදිරිස් ගොයියා පේන්න හිටියේ නෑ. ගමරාල පැලේ ගහට නැගලා බලනකොට සේදිරිස් ගොයියා නිදාගෙන හිටපු විදිහටම පිච්චිලා මිය ගිහින් තිබුණා. අන්දොරිස් ගමරාල හොඳටම බය වුනා.

කරන දේ හිතාගන්නත් බැරි වුනා. සේදිරිස් ගමරාල තමන්ගේ පැලේ පිච්චිලා ඉන්නවා දැක්කම ගමරාලට ගම්මුලාදෑනියාගෙන් සෝලි වැටෙයි කියල ගමරාල කැලේ පැන්නා. කැලේට වෙලා හොරෙන් බලාගෙන හිටියා මොකද වෙන්නේ කියලා. කැලේ තියෙන්නේ හේනේ වැටට කිට්ටුව නිසා ගමරාලට වෙන දේවල් හොදට පේනවා. අන්දොරිස් ගොයියාගේ හේන පැත්තෙන් එන දුම්රොටු පාර දැකපු අල්ලපු හේනේ සියාතු මොකද වෙන්නේ බලන්න අන්දොරිස්ගේ හේන පැත්තට ආවා. පැල සම්පුර්ණයෙන් පිච්චිලා තවමත් දුම්රොටු අහසට නගිනවා. සියාතු ඉක්මනින් පැලට නැංගා. පැලේ මුනුස්සයෙක් පිච්චිලා ඉන්නවා දැකපු සියාත් ඔලුවේ අත්දෙක බැදගෙන විලාප තියන්න ගත්තා.

සියාතුගේ සද්දේ ඇහුන ගමේ අය එකා දෙන්නා අන්දොරිස්ගේ හේන පැත්තට ඇදුනා. මේ ආරංචිය ගමේ ආරච්චිරාලටත් ආරංචිවෙලා දුවගෙන ආවා.  හැමෝම හිතුවේ අන්දොරිස් ගොයියා පිච්චිලා මියගිහින් ඉන්නවා කියලා. ආරච්චි රාලහාමි තමන්ගේ රාජකාරිය ඉටු කරලා අන්දොරිස් කියල හිතාගෙන සේදිරිස්ගේ මල සිරුර ගෙදර ගෙනියන්න අවසර දුන්නා. දැන් හැමෝම මල මිනියත් දඬු මැස්සක තියාගෙන අන්දොරිස්ගේ පැල්කොටේ වෙත ගෙන ගියා. අන්දොරිස්ගේ බිරිද මැණිකාගේ අදොනාවෙන් මුලු ගමම ශෝකයෙන් වෙලිලා ගියා.මේ සියල්ල බලාගෙන හිටපු අන්දොරිස් රෑ බෝ වෙකම්ම කැළෑ මණ්ඩියට වෙලා ඉදලා කළුවරේම තමන්ගේ ගේ පැත්තට කැලේට වහං වෙමින් හෙමින් හෙමින් ඇදුනා.

දැන් මළගෙදර කටයුතු සිදුවෙනවා. අන්දොරිස් බලාගෙන හිටියා. අන්දොරිස්ට දැන් හොඳටම බඩගිනියි. අන්දොරිස් කලුවරේම ගමේ ගෙදරකට හොරෙන් ගිහින් බත් මුට්ටියකට මාලුපිණි දාගෙන ගිහින් කැලේට වෙලා සප්පායම් වෙලා කැලේටම වෙලා හිටියා. දැන් අන්දොරිස් තමන්ගේ වේල පිරිමහගන්නේ කාගේ හරි බත් මුට්ටියක් උස්සලා සප්පායම් වීමෙන්. ටික දවසක් යනකොට ගමේ අය තමන්ගේ ගෙවල්වල බත් මුට්ටි නැතිවෙන එක ගැන තැන තැන කසුකුසු ගාන්න පටන් ගත්තා. සමහරු කිවුවේ ගමට  භූත අවතාරයක් අරක්ගෙන ඉන්නවා කියලා. තවත් අය අන්දොරිස්ගේ අවතාරය ගමේ සැරි සරනවා කියලා කතා  උනා. මේ වැඩේ දිගින් දිගටම සිද්ද උනා.




සමහරු දේවාල ගානේ ගියා. තවත් සමහරු පුද පුජා පැවැත්වුවා. ඒත් කිසිම පලක් උනේ නෑ. හැමදාම කාගේ හරි ගෙදරකින් බත් මුට්ටියක් අතුරුදහන් උනා. මේ අතර කීප දෙනෙක්ම අන්දොරිස් රාත්‍රී කාලයේ සැරි සරනවා දැකලා බය වුනා. මේ දවස්වල ගමේ යකදුරන්ටනම් සරු කාලයක් උදාවෙලා තිබුනේ ගමේ තොවිල් ගෙයක් නැති තැනක් නෑ. හැමදාම කොහේ හරි තැනක තොවිලයක්, දෙහි කැපිල්ලක් තිබුනා. දැන් ගමේ අය හවස් වේගෙන එනකොට තම තමන්ගේ පැල්කොට වලට රිංගලා දොරවල් වහගෙන ඉන්නවා. මේ අතර ගමේ පන්සලේ ලොකු හාමුදුරුවන්ගේ මැදිහත් වීමෙන් අන්දොරිස් මියගිය පැල අසල ලොකු පිරිතක් සංවිධානය කළා.

දැන් පිරිත් දවසත් උදා උනා. හාමුදුරුවරු වැඩම කරලා පිරිත් පිංකමේ වැඩ කටයුතු ආරම්භ කලා. දැන් හාමුදුරුවන් වහන්සේලා පිරිත් සජ්ඣායනා කරනවා. අන්දොරිසුත් සුදු ඇදුමක් ගෙදරක වැලකින් හොරකම් කරලා සුදු රෙද්ද පොරවාගෙන පිරිත් පොලේ කැලේට වෙන්න හිටියා. දැන් මැදියම් රැයටත් කිට්ටුයි. හාමුදුරුවරු මහ පිරිතත් ආරම්භ කරලා. මේ වෙලාවේ එක තරුණ හාමුරුවරු කෙනෙක් පිරිත් මංඩපයෙන් එලියට ඇවිත් එලියට පහලියට ගියා.



උන් වහන්සේ එක පාරම සුදු රෙද්දක් පොරවාගෙන වකුටු වෙලා ඉන්න කෙනෙක් දකිනවා. හාමුදුරුවෝ හිමීට සද්දයක් ඇහෙන්නේ නැති වෙන්න එම ස්ථානයට වැඩම කළා. එකපාරට අන්දොරිස්ට පැනගන්න වෙලාවක් හම්බ උනේ නෑ. හාමුදුරුවෝ මෙතෙක් තලක් ගමේ හොල්මන් කරපු, බත් මුට්ටි උස්සපු යකා අල්ලා ගත්තා. ඒ වෙන කවුරුත් නෙමෙයි. එදා පැලේදී පිච්චිලා මිය ගියා කියලා හිතාගෙන හිටපු අන්දොරිස් ගොයියාමයි.

අන්දොරිස් බයෙන් වෙවුලන්න ගත්තා. හාමුදුරුවෝ අන්දොරිස් හදුනාගෙන අන්දොරිස්ගේ බය දුරු කරලා පිරිත් මන්ඩපය ලගට එක්කගෙන ආවා. ගමේ මිනිස්සු හැමෝම වට උනා. සමහරු අන්දොරිස්ගෙන් විස්තර අහනවා. සමහරු අන්දොරිස් අතපතගාලා ඇත්තම මනුස්සයෙක්ද කියලා හොයලා බලනවා.  මේ වෙලාවේ ගමේ ආරච්චිරාලත් සෙනග පිරගෙන මෙතෙන්ට ආවා. අන්දොරිස්ට තේ ටිකක් බොන්න දීලා හිත සනසවලා හාමුදුරුවෝ අන්දොරිස්ගේ කතාව අහන්න ගත්තා. අන්දොරිස් තමන්ට වෙච්ච වින්නැහිය මුල ඉදලා කිවුවා. කතාව අහගෙන හිටපු අය සමහරු දුක් උනා. සමහරු සුසුම් හෙළුවා.



අන්දොරිස්ගේ බිරිද මැණිකා සතුටු කදුලු සැලුවා. දැං අන්දොරිස්ටත් පුදුම සැනසීමක් දැනෙන්නේ. අන්දොරිස් වරදක් නොකරපු බවත් බයටම සැගවෙලා හිටපු බවත් හැමෝටම තේරුනා. හැමදේම අවසානයේ අන්දෝරිස් තමන්ගේ මියගිය සහෝදරයාට පිං අනුමෝදන් කරලා මැණිකත් එක්ක තමන්ගේ පැල් කොටේට යන්නපිටත් උනා.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN No : 978-624-211-336-4